WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,643—1959 ජනවාරි 21 වැනි බදාදා—21.1.59

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : G.302/48.

ලංකාවෙහි, ප්‍රංශ අති විශේෂ හා පූර්ණබල තානාපති ලෙස බලය පවරනු ලැබූ, මොන්සියර් ලූෂන් කොලාන් උතුමාණන් වහන්සේගේ අක්තපත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

1959 ජනවාරි 16 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය.

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

---

අ.ආ.කා. අංකය—0.464/58.

ලංකාවෙහි, ඇෆ්ගනිස්තාන් අති විශේෂ හා පූර්ණබල ඇමති ලෙස බලය පවරනු ලැබූ, දෙස්තර අබ්දුල් ෂහීර් උතුමාණන් වහන්සේගේ අක්තපත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

1959 ජනවාරි 19 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය.

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

---

## මිල පාලන දැන්වීම්

කේ. ඊ. 47 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය.

එළමස් සහ හරක්මස්

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

**නියෝගය**

කැගල්ල දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිල පාලක තැන්පත් නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1950හේ අංක 29 දරණ මිල පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,617 සහ 1958 දෙසැම්බර් 16 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක කේ.ඊ. 45 සහ 1958 දෙසැම්බර් 13 වැනි දින දරණ ආහාර මිල නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 සිට 5 දක්වා ඇති තීරවල සඳහන් මිල එළමස් හෝ මෙරට හරක්මස් රාත්තලක වැඩිම මිල වශයෙන් මෙම නියෝගයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළමස් හෝ මෙරට හරක්මස් එම උපලේඛනයේම 1 වැනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශය තුළ එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා —

(අ) ''එළුමස්'' යනුවෙන් හැඟවෙන්නේ බැටළුවකුගේ හෝ එළුවකුගේ මාංශයයි. බොකු, බඩවැල් ආදී සියලු ආකාර ඉවත් කරනු ලබන දෑය මීට ඇතුළත් නොවේ.

(ආ) ''මෙරට හරක්මස්'' යනුවෙන් හැඟවෙන්නේ ඇති කරන ඉන්දියානු හෝ සිංහල ගවයන්ගේ හෝ මීහරකුන්ගේ මාංශයයි. බොකු, බඩවැල් ආදී සියලු ආකාර ඉවත්කරනු ලබන දෑය මීට ඇතුළත් නොවේ.

(4) කටු සහිත එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට විසි පහකට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසියම් තැනක හෝ වාහනයක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උපලේඛනයෙහි සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් ඇති සෑම වෙළෙන්දකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරනලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(6) ඉවත් කරනු ලබන දෑය සමඟ එළුමස් හෝ මෙරට හරක්මස් එකම ගනුදෙනුවකදී විකුණනු ලබන විට එළුමස් හෝ මෙරට හරක්මස් ඉවත් කරනු ලබන දෑයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(7) සෑම වෙළෙන්දෙකුම එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන කල්හි එළුමස් හෝ මෙරට හරක්මස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලාගැනීමට හැකිවනසේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(8) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන සෑම වෙළෙන්දකුම එළුමස් හෝ මෙරට හරක්මස් ලබාගන්නකු ඉල්ලා සිටිය විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ —

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ එළුමස් හෝ මෙරට හරක්මස් ප්‍රමාණය (බර),

(ඇ) විකුණූ එළුමස් හෝ මෙරට හරක්මස් වල විස්තරය සහ,

(ඈ) විකුණූ මස් ප්‍රමාණයට ගෙවූ මුදලද,

සඳහන් විය යුතුයි.

(9) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනලද සෑම ප්‍රදේශයක් තුළ කිසිවකු උපලේඛනයේ සඳහන් දෑය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමඟ කලවම්කොට නොවිකිණිය යුතුයි.

(10) උපලේඛනයේ සඳහන් දෑය විකුණන කල්හි, එකී දෑය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛනයේ 2 සිට 5 වැනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(11) මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

වර්ෂ 1959 යේ ජනවාරි මස 16 වැනි දින, පෙරවරු 10ට කෑගල්ලේදී අත්සන් කරනලදී.

නාගමුත්තු පුලේන්දිරන්,
කෑගලු දිසාවේ උප (ආහාර) මිළ පාලකතැන.

උපලේඛනය

| 1 වැනි තීරය | | 2 වැනි තීරය | | 3 වැනි තීරය | | 4 වැනි තීරය | | 5 වැනි තීරය |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රදේශය | | එළුමස් (කටු රහිත) රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. | | එළුමස් (කටු සහිත) රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. | | මෙරට හරක්මස් (කටු රහිත) රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. | | මෙරට හරක්මස් (කටු සහිත) රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. |
| කෑගල්ල පාලන දිස්ත්‍රික්කය | ... | 2 0 | ... | 1 75 | ... | 0 70 | ... | 0 60 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී